සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

88 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

### ශිල්ප කලා - I

නම/විභාග අංකය : ..................................... කාලය : පැය 01 යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(01) අතීතයේ සිට පැවත එන්නාවූ සිව්සැට කලාව ප්‍රධාන වශයෙන් ප්‍රභේද දෙකකට වෙන්කර තිබේ. එම කලාවන් හඳුන්වන්නේ,
(1) මූර්ති කලාව, කැටයම් කලාව (2) ජනකලාව, විදග්ධ කලාව
(3) ශ්‍රව්‍ය කලාව, දෘශ්‍ය කලාව (4) චිත්‍ර කලාව, ශ්‍රව්‍ය කලාව

(02) විවිධාකාර වෘත්තීන් සමඟ මුසු වී ආරම්භ වූ ජනකලාව ප්‍රධාන වශයෙන් කොටස් තුනකි. එයින් ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවට අයත් වන්නේ,
(1) ශාන්තිකර්ම, වන්නම් (2) ගොයම්කවි, පැල්කවි
(3) කරත්තකවි, පැල්කවි (4) සොකරිනාට්‍ය, නැළවිලිගී

(03) "සත්සියක් කපුමල් රැගෙන මම" යන ගීතයෙන් අපට කියවෙන්නේ අතීතයේ රෙදිපිළි නිෂ්පාදනය තිබූ බවයි. මෙම ගීතය ඇතුළත් නාට්‍ය කුමක් ද?
(1) මනමේ නාට්‍යය (2) සිංහබාහු නාට්‍යය
(3) කුවේණි නාට්‍යය (4) රත්නමාලී නාට්‍යය

(04) ලාක්ෂා කර්මාන්තය සම්ප්‍රදායිකව පවත්වාගෙනු ලබන ප්‍රධාන ප්‍රදේශ තුන මොනවා ද?
(1) අනුරාධපුරය, ගාල්ල, මහනුවර (2) හුරිකඩුව, මාතලේ, අනුරාධපුරය
(3) මාතර, ගාල්ල, හුරිකඩුව (4) පල්ලෙහපුවිද, අඟුල්මඩුව, හුරීකඩුව

(05) ලාක්ෂා කෘමියන් බහුල වශයෙන් ජීවත්වන ශාක හඳුන්වන්නේ,
(1) කෝන්, තලකිරියා, කැප්පෙටියා, පිහිඹියා
(2) තලකිරියා, එරඬු, කෝන්, හල්මිල්ල
(3) තේක්ක, හල්මිල්ල, කෝන්, කොස්
(4) කැප්පෙටියා, කෝන්, හල්මිල්ල, තේක්ක

(06) වෙස් මුහුණු කලාව, රූකඩ කලාව හා එක්ව සංවර්ධනය වූ කලාවක් ලෙස හැඳින්විය හැකිය. මෙම කලාවන් සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශ මොනවා ද?
(1) දෙවුන්දර, මාතර, මාතලේ, අම්බලන්ගොඩ
(2) දෙවුන්දර, මිරිස්ස, උඩුපිල, අම්බලන්ගොඩ
(3) මාතලේ, මාතර, මහනුවර, ගාල්ල
(4) මිරිස්ස, දෙවුන්දර, ගාල්ල, මාතර

(07) දහඅට සන්නිය, දොළහ පාලිය ආදී ශාන්තිකර්ම සඳහා භාවිත කරන වෙස්මුහුණු වර්ගය හඳුන්වන්නේ.
(1) යක් නැටුම්, වෙස් මුහුණු (2) නාඩගම්, වෙස් මුහුණු
(3) කෝලම් නැටුම්, වෙස් මුහුණු (4) රාජ වෙස් නැටුම්, වෙස් මුහුණු

(08) වෙස් මුහුණු කැපීම සඳහා සුදුසු සැහැල්ලු ලී වර්ග මොනවා ද?

(1) හල්මිල්ල, කඳුරු, කොස් (2) රුක් අත්තන, පිහිඹියා, කොස්

(3) කඳුරු, රුක් අත්තන, එරබදු (4) එරබදු, හල්මිල්ල, තේක්ක

(09) අතීතයේ පිත්තල කර්මාන්තකරුවන් හඳුන්වන්නේ,

(1) ලෝකුරුවන් (2) තඹ කරුවන් (3) රිදීකරුවන් (4) කුඹල් කරුවන්

(10) පිත්තල කර්මාන්තය සඳහා ඉතා ප්‍රසිද්ධ පිළිමතලාව ප්‍රදේශය පිහිටා ඇත්තේ,

(1) මාතර ය. (2) ගාල්ල ය. (3) මහනුවර ය. (4) නුවරඑළියෙහි ය.

(11) තඹ හා පිත්තල ලෝහ සඳහා යොදා ගන්නා මිශ්‍රණ අනුපාතය වන්නේ,

(1) 2.1 කි. (2) 2.3 කි. (3) 2.4 කි. (4) 2.6 කි.

(12) විදේශිකයන්ගෙන් අප ලද දායාදයක් වන වර්තමානයේ ජනප්‍රිය පවතින කලාවකි. එම කලාව හඳුන්වන නාමය කුමක් ද?

(1) පේෂ කර්මාන්තය (2) මැටි කර්මාන්තය

(3) බීරළු කර්මාන්තය (4) පිත්තල කර්මාන්තය

(13) පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව වෙනුවෙන් බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රය තුළ ''අපේගම'' පිහිටුවන ලද්දේ කිනම් වසරේ ද?

(1) 2012 වසරේ දී (2) 2013 වසරේ දී

(3) 2014 වසරේ දී (4) 2016 වසරේ දී

(14) කාර්මික චිත්‍ර සාර්ථක ලෙස ඇඳීම සඳහා භාවිතා කරන උපකරණ හා ද්‍රව්‍ය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඇඳීම් කඩදාසි, කවකටුව, අල්පෙනතිය

(2) ඇඳීම් කඩදාසි, කවකටුව, බෙදුම් කටුවය

(3) ඇඳීම් කඩදාසි, කවකටුව, හැට්ට කටුවය

(4) ඇඳීම් කඩදාසි, කවකටුව, පාට පැන්සල්ය

(15) ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය ඇඳීම් කඩදාසි වර්ග කර ඇති ප්‍රමාණය වන්නේ,

(1) $A_0$ සිට $A_{40}$ දක්වා ය. (2) $A_0$ සිට $A_{20}$ දක්වා ය.


(3) $A_0$ සිට $A_5$ දක්වා ය. (4) $A_0$ සිට $A_{10}$ දක්වා ය.

(16) එදිනෙදා අප වැඩි වශයෙන් භාවිතා කරන්නේ කුමන අක්ෂරයේ පැන්සල් ද?

(1) HB පැන්සල් ය. (2) 2H පැන්සල් ය.

(3) B අක්ෂරයේ පැන්සල් ය. (4) 2B පැන්සල් ය.

(17) රූපයේ දැක්වෙන විහිත චතුරස්‍රයෙන් නිර්මාණ කළ හැකි කෝණ සහිත පිළිතුර වන්නේ,



(1) $45^0$, $90^0$, $75^0$ කෝණය

(2) $45^0$, $105^0$, $15^0$ කෝණය

(3) $90^0$, $60^0$, $30^0$ කෝණය

(4) $90^0$, $60^0$, $45^0$ කෝණය

(18) ජ්‍යාමිතික උපකරණ කට්ටලයේ ඇති කෝණමාණයේ සලකුණු කර ඇති අගය වන්නේ,

(1) $180^0$ යි. (2) $90^0$ යි.


(3) $60^0$ යි. (4) $360^0$ යි.

(19) වෘත්ත චාප සහ වක්‍ර රේඛා ඇඳීමට අප භාවිතා කරන ජ්‍යාමිතික උපකරණය වන්නේ,


(1) කෝණමාණය යි. (2) බෙදුම් කටුව


(3) කවකටුව (4) T රූලයි.


(20) සම්මත රේඛාවක් වන ඝන අඛණ්ඩ රේඛාව භාවිතා කරන්නේ කුමන අවස්ථාවේදී ද?
(1) සැඟි දාර දැක්වීම සඳහා ය. (2) කඩ පෘෂ්ඨය දැක්වීම සඳහා ය.
(3) නිර්මාණ රේඛා දැක්වීම සඳහා ය. (4) වස්තුවක පෙනෙන දාර දැක්වීම සඳහා ය.

(21) 
මෙම රූපයේ දැක්වෙන්නේ කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?
(1) සම ද්විපාද ත්‍රිකෝණය
(2) සමපාද ත්‍රිකෝණය
(3) විෂම පාද ත්‍රිකෝණය
(4) සුළු කෝණී ත්‍රිකෝණය


(22) පාද දෙකක් පමණක් සමාන්තර චතුරස්‍රය හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) සමචතුරස්‍ර ලෙස ය. (2) ආයත චතුරස්‍රය ලෙස ය.
(3) රොම්බසය ලෙස ය. (4) ත්‍රිපීසියම ලෙස ය.

(23) 
මෙම රූපයෙන් දැක්වෙන්නේ,
(1) වෘත්ත රටාවකි
(2) ඒක කේන්ද්‍රික වෘත්ත
(3) කේන්ද්‍රය නොදත් වෘත්තය
(4) කේන්ද්‍රික ඛණ්ඩ සහිත වෘත්තය

(24) පහත වෘත්තයේ අඳුරු කළ කොටස් හඳුන්වන්නේ

(1) චාපය ලෙස ය.
(2) වෘත්ත ඛණ්ඩය ලෙස ය.
(3) ජ්‍යාය ලෙස ය.
(4) වෘත්ත පාද ලෙස ය.

(25) මෙහි දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණය කුමක් ද?


(1) AB රේඛාවේ ලම්බ සමච්ඡේදයකි.
(2) Q ලක්ෂ්‍යයේ සිට AB රේඛාවට ලම්බයක් ඇඳීම ය.
(3) P ලක්ෂ්‍යයේ සිට AB රේඛාවට ස්පර්ශයක් ඇඳීම ය.
(4) AB රේඛාවේ සිට P ලක්ෂ්‍යයට ලම්බයක් ඇඳීම ය.


(26) මෙම නිර්මාණයේ දැකිය හැකි ජ්‍යාමිතික හැඩතල සහිත පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) පංචාස්‍රය, ත්‍රිකෝණ, වෘත්තය
(2) ෂඩාශ්‍රය, ත්‍රිකෝණය, වෘත්තය
(3) චතුරස්‍රය, ත්‍රිකෝණය, වෘත්තය
(4) සප්තාස්‍රය, ත්‍රිකෝණය, වෘත්තය

(27) පංචාස්‍ර නිර්මාණයේ දී රූපවල සමබර බවක්, පාදවල හා කෝණවල අගයෙහි සමාන බවක් දැකිය නොහැකි වන්නේ කුමන ක්‍රමයක ද?
(1) විධිමත් ක්‍රමය ය. (2) පොදු ක්‍රමය ය.
(3) විශේෂ ක්‍රමය ය. (4) අවිධිමත් ක්‍රමය ය.

(28) 50mm අරයකට වෘත්තයක් ඇඳ එම අරය වෙනස් නොකට පරිධිය සමාන කොටස්වලට බෙදා ඡේදිත ලක්ෂ්‍යයක් යා කළ විට ලැබෙන නිර්මාණය හඳුන්වන නාමය වන්නේ,
(1) පංචාස්‍රය ලෙස ය. (2) ෂඩාශ්‍රය ලෙස ය.
(3) සප්තාස්‍රය ලෙස ය. (4) දසාශ්‍රය ලෙස ය.

(29) යම් වස්තුවක් තලයකට දිග හැර ඇඳීම ජ්‍යාමිතික නිර්මාණවල දී හඳුන්වනු ලබන්නේ,
(1) නිර්මාණ ලෙස ය. (2) රූපීය පෙනුම ලෙස ය.
(3) විකසනය ලෙස ය. (4) පතොරම ඇඳීම ලෙස ය.

(30) පහත දැක්වෙන්නේ මූලික ඝන වස්තුවක රූප සටහනකි. එම ඝන වස්තුව වන්නේ,
(1) සිලින්ඩරයකි. (2) ප්‍රිස්මයකි.
(3) ගෝලයකි. (4) පිරමීඩයකි.



(31) ස්වාභාවික වර්ණ භාවිතයෙන් කළ පැරණි චිත්‍ර දැකිය හැකි ස්ථානයකි.
(1) බස් නැවතුම්පලේ චිත්‍ර (2) සීගිරි චිත්‍ර
(3) ගංගාරාමයේ චිත්‍ර (4) නව පැරණි විහාරයේ චිත්‍ර

(32) අතීතයේ දී ස්වාභාවික වර්ණවලින් සිතුවම් නිර්මාණය කිරීමේ දී කහ වර්ණය ලබා ගැනීමට භාවිතා කළේ මොනවා ද?
(1) වතුර මැටි (2) සාදිලිංගම් (3) ගොකටු කිරි (4) නිල්අවරිය

(33) පහත සඳහන් වර්ණ අතරින් තෘතික වර්ණවලට අයත් කාණ්ඩය තෝරන්න.
(1) නිල්, කහ, රතු (2) රතුදම්, නිල්දම්, රතුරඹ
(3) නිල්, රතුදම්, කොළ (4) කොළ, සුදු, කහ

(34) ශාක කෙඳිවලට කැඳ දැමීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?
(1) නූල්වලට ශක්තිමත් බවක් ලබා දීම.
(2) නූල්වල දුඹුරු පැහැය ඉවත් කිරීම.
(3) ශාක කෙඳිවල ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.
(4) රෙදි සායම් ගැන්වීමේ දී සායම් උරා ගැනීම පහසු කිරීම.

(35) සේද කෙඳි එකිනෙකට සම්බන්ධ වී ඇත්තේ කුමක් නිසා ද?
(1) සේද කෙඳිවලට යොදා ඇති වර්ණ නිසා
(2) සේද කෙඳිවලට වර්ණ යොදා ඇති නිසා
(3) සේද කෙඳිවලට කෙමිපික්ස් මැලියම් දමා ඇති නිසා
(4) සේද කෙඳිවල සෙරසින් නැමති මැලියම් ඇති නිසා

(36) රෙදිවල ස්වාභාවික දුඹුරු පැහැය ඉවත් කිරීම සඳහා කළ හැක්කේ කුමක් ද?
(1) සබන් යොදා සේදීම. (2) විරංජනය කළ යුතුය.
(3) නිල් දැමිය යුතුය. (4) කාබනීකරණය කළ යුතුය.

(37) රෙදි පිළි අලංකරණයේ දී මුද්‍රණය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
(1) මුළු පෙහෙකම් ද්‍රව්‍ය පුරා ම වර්ණ පැතිරවීම.
(2) තෝරාගත් ප්‍රදේශයක පින්සලක් මඟින් සායම් ගැල්වීම.
(3) සායම් ඉසින යන්ත්‍රයකින් සායම් ඉසීම.
(4) කෙසෙල් පිති බණ්ඩක්කා වැනි උපකරණ මඟින් රෙද්ද මත සායම් සහිත මුද්‍රා තැබීම.

(38) නිල් කහ වර්ණය මිශ්‍ර කිරීමෙන් සාදා ගත හැකි වර්ණය කුමක් ද?
(1) කොළ පාට වර්ණය (2) දම් වර්ණය
(3) තැඹිලි වර්ණය (4) නිල්දම් වර්ණය

(39) දුඹුරු වර්ණයට තද දුඹුරු වර්ණයක් ලබා ගැනීම සඳහා එක්කල යුතු වර්ණය කුමක් ද?
(1) සුදු (2) රතු (3) කළු (4) නිල්

(40) ලෝම කෙඳිවල ඇති අපද්‍රව්‍ය රසායනික ද්‍රව්‍ය මඟින් පිළිස්සීමට ලක් කිරීම හඳුන්වන නම කුමක් ද?
(1) කාබනීකරණය (2) මළහරණය
(3) විරංජනය (4) කැඳ හරණය

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

88 | S | I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 10 - 2020

ශිල්ප කලා - II

නම/විභාග අංකය : ......................................   කාලය : පැය 02 යි.

වැදගත් :

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(01) ජන කලා කේන්ද්‍රයේ පැවැත්වූ දේශීය කලා කර්මාන්ත ප්‍රදර්ශණයේ දී "දේශීය දේ අගයමු" තේමාව යටතේ දේශීය නිෂ්පාදන මෙන්ම නව අත්කම් භාණ්ඩ ද නිර්මාණය කර තිබුණි. මෙම ප්‍රදර්ශනය නැරඹීම සඳහා පාසල් සිසුන්ට ද අවස්ථාව ලබා දී තිබුනි.

(1) අත්කම් භාණ්ඩ සෑදීමට භාවිත කළ හැකි දේශීය ශාක වර්ග දෙකක් ලියන්න.

(2) එම ශාක වර්ගවලින් නිර්මාණය කළ හැකි අත්කම් භාණ්ඩ දෙකක් නම් කරන්න.

(3) ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා යොදා ඇති පොල්තෙල් පහන සෑදීමට ගත හැකි ශාක වර්ග දෙකක් නම් කරන්න.

(4) ප්‍රදර්ශන කුටි අලංකාර කිරීමට සුදුසු මල් වර්ග 04 ක් නම් කරන්න.

(5) ප්‍රදර්ශන කුටියට ඇතුළු වන දොරටුව දෙපස පුන්කලස් තබා තිබුණි. එම පුන්කලස් සැරසීමට ගත හැකි දේශීය ශාක වර්ග 02ක් ලියන්න.

(6) නිවේදන පුවරුව අලංකාර කිරීමට සුදුසු ස්වාභාවික ද්‍රව්‍ය 02ක් ලියා එහි දළ රූප සටහනක් අඳින්න.

(7) රෙදි කැබලි ආශ්‍රයෙන් කළ හැකි නිර්මාණ 02ක් ලියන්න.

(8) ස්වාභාවික ඇට වර්ග සහ කෘතිම පබළු වර්ග යොදා ගනිමින් ඉතා අලංකාර නිර්මාණ කර තිබුනි. එයින් ඔබ කැමති නිර්මාණ 02ක් ඇඳ දක්වන්න.

(9) ප්‍රදර්ශන කුටියක තබා තිබූ එක් එක් වර්ගයේ වෙස් මුහුණු දක්නට තිබුණි. නරඹන්නන්ට ද ඉතා ප්‍රියජනක විය. වෙස් මුහුණු වර්ග 02ක් නම්කර ඔබ කැමති වෙස් මුහුණක් ඇඳ දක්වන්න.

(10) ඉහත දක්වා ඇති තේමාවට අනුව වෙනත් තේමා පාඨයක් නිර්මාණය කරන්න.

(02) ශ්‍රී ලාංකිකයින් වන අප සිව්සැට කලාවකට උරුමකම් කියති.

(1) ජන කලාවේ ප්‍රධාන කොටස් කීය ද? ඒ මොනවා ද? (ලකුණු 02)

(2) ජන කලාවට අයත් කර්මාන්ත 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(3) පියපුතු උරුමයෙන් පාරම්පරිකව පැවත එන කර්මාන්තය නම් කර එම කර්මාන්තය ප්‍රචලිත ප්‍රදේශ 03ක් නම් කරන්න. (ලකුණු 04)

(03) රූකඩ කලාව හා එක්ව සංවර්ධනය වූ කලාවක් ලෙස වෙස්මුහුණු කලාව දැක්විය හැකිය.

(1) මුහුණේ ස්වරූපය හා වෙස් මුහුණු යොදා ගන්නා කාර්ය අනුව ප්‍රධාන කොටස් 02 කි. ඒ මොනවා ද? (ලකුණු 02)

(2) රජය මගින් ජනකලාවන් සුරැකීම සඳහා ගෙන ඇති පියවරෙන් 04ක් ලියන්න. (ලකුණු 04)

(3) ලෝහවලින් ආභරණ නිපදවා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(04) ජ්‍යාමිතික ඇඳීම රේඛා හා සංකේත රාශියකින් සමන්විත වූ විශ්ව භාෂාවක් ලෙස හැඳින්වේ.

(1) ජ්‍යාමිතික ඇඳීම ප්‍රධාන වශයෙන් දෙයාකාර ය. එම ආකාර 02ක නම් කරන්න. (ලකුණු 02)

(2) ජ්‍යාමිතික උපකරණ කට්ටලය නම් කරන්න. (ලකුණු 04)

(3) සම්මත රේඛා වර්ග 04ක් ඇඳ නම් කරන්න. (ලකුණු 04)

(05) සරල රේඛා එකිනෙක සම්බන්ධ වන ආකාරය අනුව විවිධ ජ්‍යාමිතික නිර්මාණ අවස්ථා බිහිවේ.

(1) කෝණ වර්ග 04ක් නම් කරන්න. (ලකුණු 02)

(2) 7 cm ක් දිග සරල රේඛාවක් සමාන කොටස් 05කට බෙදා දක්වන්න. (ලකුණු 04)

(3) පාදයක දිග 4 cm ක් වූ සමචතුරස්‍රයක් නිර්මාණය කරන්න. එහි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

(06) රෙදිපිළි වර්ණ ගැන්වීමේ දී භාවිත කරන සායම් විශේෂ පිළිබඳ මනා දැකීමක් තිබීම වැදගත් වේ.

(1) මූලික වර්ණ මොනවා ද? (ලකුණු 02)

(2) සායම් භාවිතයෙන් රෙදිපිළි අලංකරණයේ දී යොදා ගන්නා ක්‍රමවේදයන් මොනවා ද?
ඒවා හඳුන්වන්න. (ලකුණු 04)

(3) වර්ණ ආලේපකරණයේ ක්‍රම සහ විධි මොනවා ද? (ලකුණු 04)

(07) රෙදි පිළි අලංකරණයේ දී පෙර පිරියම් හා පසු පිරියම් කිරීම වැදගත් අවස්ථා දෙකකි.

(1) පෙර පිරියම් ක්‍රම මොනවා ද? (ලකුණු 02)

(2) පිළි අලංකරණ ක්‍රම 04ක් නම් කරන්න. (ලකුණු 04)

(3) අතින් පින්තාරු කිරීම සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න. (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

88 S I,II

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 10 - 2020

## ශිල්ප කලා - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (2) | 11. | (1) | 21. | (3) | 31. | (2) |
| 02. | (1) | 12. | (3) | 22. | (4) | 32. | (3) |
| 03. | (3) | 13. | (2) | 23. | (2) | 33. | (2) |
| 04. | (4) | 14. | (2) | 24. | (4) | 34. | (1) |
| 05. | (1) | 15. | (4) | 25. | (1) | 35. | (4) |
| 06. | (2) | 16. | (1) | 26. | (2) | 36. | (2) |
| 07. | (1) | 17. | (3) | 27. | (4) | 37. | (4) |
| 08. | (3) | 18. | (1) | 28. | (2) | 38. | (1) |
| 09. | (1) | 19. | (3) | 29. | (3) | 39. | (3) |
| 10. | (3) | 20. | (4) | 30. | (2) | 40. | (1) |

## II පත්‍රය

(01) (1) පන්, ඉදිකොළ, වැටකේ, තල්කොළ, ආදිය

(2) පැදුරු, වට්ටි, පෙට්ටි, බෑග්, මළු ආදිය

(3) කෙසෙල් කොට, ස්වාභාවික ශාක ආදිය

(4) බාබන්ඩේසියා, ඇන්තූරියම්, බෝගන්විලා, අරලිය ආදිය.

(5) පොල්මල්, පුවක්මල්, වැටකේ ආදිය.

(6) ඇන්තූරියම්, මල්වර්ග, පොල්කොළ, ගොක්කොළ, කිතුල් රැහැන්, ස්වාභාවික ශාක කොටස් ආදිය.

(7) බිත්තිසැරසිලි, පාපිසි, කුෂන් කවර ආදිය

(8) අදාළ නිර්මාණ 02ක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(9) කෝලම් රංගන වෙස් මුහුණු, යක්නැටුම් වෙස් මුහුණු කැමති වෙස් මුහුණු ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(10) සුදුසු තේමා පාඨයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(02) (1) 03 කි.

- ශ්‍රව්‍ය කලා, දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය දෘශ්‍ය කලා

(2) ලාක්ෂා කර්මාන්තය, පේෂ කර්මාන්තය, මැටි කර්මාන්තය, බීරළු කර්මාන්තය, පිත්තල කර්මාන්තය ආදිය.

(3)
- ලාක්ෂා කර්මාන්තය
- මාතලේ පල්ලෙ හපුවිද
- මාතර අගුල් මඩුව
- මහනුවර හුරිකඩුව

(03) (1) 02 කි.

- කෝළම් නාට්‍ය වෙස් මුහුණු
- යක් නැටුම් වෙස් මුහුණු

(2)
- ජනකලා නිර්මාණ සඳහා ජනපද පිහිටුවීම.
- ජනකලා අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම.
- විදේශිකයන් සඳහා අත්කම් නිර්මාණ කිරීම.
- අපේගම පිහිටුවීම.
- දිවා / රාත්‍රී අත්කම් ප්‍රදර්ශන අලෙවිසැල් පිහිටුවීම.

(3) ලෝහ උණුකර වාත්තුකර හෝ තලා අතින් හැඩකර සරල උපකරණ භාවිතයෙන් ආභරණ නිපදවා ගැනීම.

(04) (1) තල ජ්‍යාමිතිය, ඝන ජ්‍යාමිතිය

(2) කවකටුව, කෝදුව, විහිත චතුරස්‍ර යුගලය, කෝණමානය, බෙදුම් කටුව, පැන්සල, මකනය

(3) ඇඳ නම්කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(05) (1) ඍජු කෝණ, සරල කෝණ, මහා කෝණ, සුළු කෝණ, පරාවර්ත කෝණ

(2) නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(3) සමචතුරස්‍රය ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

**ලක්ෂණ**

- පාද හා කෝණ සමාන වේ.
- කෝණයක අගය $90^0$ වේ.

(06) (1) නිල්, කහ, රතු

(2) සායම් පෙවීම, සායම් ආලේපනය, මුද්‍රණය

(3) සේදුම. යටි ආලේපනය, අඳුරුකරණය, ආලෝකකරණය

(07) (1) කැඳහරනය, මලහරණය, විරංජනය

(2) අතින් පින්තාරුව, ස්ටෙන්සිල් කිරීම, මුද්‍රා තැබීම, අච්චු මුද්‍රණය ආදිය.

(3) සුදුසු මෝස්තරයක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.